# සාම්ප්‍රදායික ජනක්‍රීඩා වෙනස්වීම හමුවේ ශ්‍රී ලාංකේය අනන්‍යතාව අර්බුදයට ලක්වීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

දෙල්දූවේ ඤාණසුමන හිමි[1]

## හැඳින්වීම

අනාදිමත් කාලයක පටන් පැවත එන්නා වූ ලාංකේය අනන්‍යතාව ලොවට විදහාලන කැඩපතකි, සාම්ප්‍රදායික ජනක්‍රීඩා. සමාජයකින් තවත් සමාජයකට ජන වර්ගයකින් තවත් ජන වර්ගයකට තත් සංස්කෘතියට ආවේණික ජනක්‍රීඩා තිබේ. ජනක්‍රීඩා හෙවත් ජනතාවගේ ක්‍රීඩා බිහිවන්නේ ගැමි සමාජය තුළ ම ය. ප්‍රධාන වශයෙන් ජනක්‍රීඩාවක් බිහිවීමට මුල්වන කරුණු කිහිපයක් තිබේ. ඒවා නම් ආගමික බලපෑම්, දේශපාලන බලපෑම්, සංස්කෘතික බලපෑම්, ශාස්ත්‍රිය බලපෑම යනුවෙනි. ආගමික පසුබිම මුල් කරගෙන බිහිවූ ක්‍රීඩා ලෙස **'අං ඇදීම, පොර පොල් ගැසීම, ඔලිඳ කෙළිය'** ප්‍රධාන වේ. දේශපාලනික හෝ ශාස්ත්‍රීය බලපෑම් මත බිහිවූ ක්‍රීඩා ලෙස **අලියාට ඇස තැබීම, වාසනා මුට්ටි බිඳීම** හැඳින්වීමට හැකි ය. පැරණි ජනක්‍රීඩා අතරට ගැනෙන ප්‍රධාන ක්‍රීඩා කිහිපයක් ලෙස **'චක්ගුඩු, කඹ ඇදීම, මෝල් ගහේ දලු කැඩීම, රටවල් ඇල්ලීම, ගුඩු විදිල්ල, සීරුමාරු හා මගුල් පරක්කුව'** හැඳින්විය හැකිය. කාලයාගේ ඇවෑමෙන් තත් ක්‍රීඩා අප සංස්කෘතියෙන් ගිලිහෙමින් පවතින අතර, ඊට ආදේශක ලෙස නව ක්‍රීඩා රැසක් අප සංස්කෘතිය වෙලාගෙන තිබේ. ඒවා අතර **'බනිස් කෑම, බෝතලයට වතුර පිරවීම, සීනි බෝල සෙවීම, සංගීත පුටු තරගය'** ප්‍රධාන වේ. ජන වර්ගයක සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹු කිරීම උදෙසා ජනක්‍රීඩා කෙතෙක් දුරට උපයෝගී වේ ද? නූතන සමාජ විපර්යාස හමුවේ ලාංකේය ජනක්‍රීඩාවල වර්තමාන ස්වභාවය කෙබඳු ද? යන්න විමසීම මෙහි පර්යේෂණ ගැටලුවයි. පැරණි ජනක්‍රීඩා මඟින් ලාංකේය අනන්‍යතාව පෙන්වා දීම හා හර පද්ධතිය සුරක්ෂිත කරණු සඳහා නූතන ක්‍රීඩා වෙනස් විය යුතු ආකාරය සාකච්ඡා කිරීම මෙහි පර්යේෂණ අරමුණ වෙයි. පුද්ගල චින්තන සංවර්ධනය හා බැඳීම් ශක්තිමත් කිරීම සඳහා සාම්ප්‍රදායික ජනක්‍රීඩා මඟින් සිදු වූ සමාජ සුබසිද්ධිය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ වැදගත්කමයි. මෙම පර්යේෂණය ජනක්‍රීඩා කිහිපයකට පමණක් සීමා වී සිදු කරණ ලදී. ජනක්‍රීඩා පිළිබඳව විවිධ විද්වතුන් විසින් කරන ලද අධ්‍යයන විද්‍යමාන වේ. ඒ අතුරින් කිහිපයක් පහත පරිදි වේ.

කාන්තාවන් කේන්ද්‍රීය ජනක්‍රීඩාවන්හි සමාජ හා මානව විද්‍යාත්මක වටිනාකම (කාන්තාවන්ට ආවේණික සිංහල ජනක්‍රීඩා කිහිපයක් ආශ්‍රයෙන් සිදු කෙරෙන විමර්ශනයකි). යන ප්‍රස්තුතය මුල් කරගනිමින් එස්. ඉහලගම විසින් ජනක්‍රීඩාවන්ට අදාල පර්යේෂණයක් සිදු කර තිබේ. එහිදි කාන්තාවන්ට ආවේණික ජනක්‍රීඩා කිහිපයක කාන්තා සලකුණ පිළිබඳවත්, එහිලා වටිනා කම පිළිබඳවත් කරුණු ගොනුකොට තිබේ. (ඉහලගම, එස්., (2015). ගම්මඩු ශාන්තිකර්මය මුල්කර ගත් අංකෙළිය ජනක්‍රීඩාව පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක්. යන ප්‍රස්තුතය මුල් කරගනිමින් යු.ජේ.ජේ. ගමගේ,

1 පළමු වසර, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම.
gnanasumanadelduwe@gmail.com

කේ.එච්. ලොකුහැන්නැදිගේ යන අය විසින් අංකෙළිය ජනක්‍රීඩාවෙහි පවතින ශාන්ති කර්ම ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කර තිබේ. (ගමගේ, ජේ.ජේ.යු., ලොකුහැන්නැදිගේ කේ.එච්., (2020). සාම්ප්‍රදායික අංකෙළියඃ විල්ලද්දර පුරාණ රජමහා විහාරය ඇසුරෙන් විමසුමක්. යන ප්‍රස්තුතය මුල් කරගනිමින් ඩබ්. සුදර්ශිකා ශ්‍යාමලී ප්‍රියදර්ශනී විසින් ජනක්‍රීඩාවක් ලෙස තත් ක්‍රීඩාවෙහි සංස්කෘතික පසුබිම, ආගමික පසුබිම මෙන්ම නීති රීති පිළිබඳ සාකච්ඡා කර තිබේ. (සුදර්ශිකා ශ්‍යාමලී ප්‍රියදර්ශනී, ඩබ්., (2025). A Study on the Origins of Children Games. යන ප්‍රස්තුතය මුල් කරගනිමින් P. Perera විසින් ළමා ජනක්‍රීඩා කිහිපයක් පිළිබඳ අධ්‍යයනය කොට තත් ක්‍රීඩාවන්හි ප්‍රභවය, සමාජ පසුබිම, ක්‍රීඩා කරණ ආකාරය යන කරුණු පිළිබඳව සාකච්ඡා කොට තිබේ. (Perera, P., (2021). Exploring The Role of Sri Lankan Traditional Games in Promoting Physical Development Among Children: in Light of Literature. යන ප්‍රස්තුතය මුල් කරගනිමින් A.Yumna, Y. Rathnayake, D. Ranasinghe යන පර්යේෂකයන් විසින් ළමුන්ගේ භෞතික සංවර්ධනය උදෙසා ළමා ජනක්‍රීඩා වල උපයෝගිතාව සහ තත් ක්‍රීඩාවන්හි කාර්ය භාරය පිළිබඳව ගවේෂණය කර ප්‍රතිඵල සාකච්ඡා කොට තිබේ. (Yumna, A., Rathnayake, Y. and Ranasinghe, D. (2023). Traditional Games and the Sri Lankan Culture Reflection of Traditional Games as a Component of, mplicit Culture of Sri Lanka. යන ප්‍රස්තුතය මුල් කරගනිමින් H.P.N. Perera විසින් ජනක්‍රීඩාවල සංස්කෘතික වටිනාකම පිළිබඳව කරුණු දක්වා තිබේ. Perera, H.P.N. (2023).

ඉහතින් සාකච්ඡා කරණ ලද්දේ මීට අදාළ සාහිත්‍ය විමර්ශන යයි. සාම්ප්‍රදායික ජනක්‍රීඩා වෙනස්වීම හමුවේ ශ්‍රී ලාංකේය අනන්‍යතාව අර්බුදයට ලක්වීම පිළිබඳ සෘජු අධ්‍යයනයක් විද්‍යමාන නොවන බැවින් තත් ඌනතාව සපුරණු වස් මෙම පර්යේෂණ සිදු කරන ලදි.

**ක්‍රමවේදය**

මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර, සාහිත්‍යයික මූලාශ්‍රය මුල් කොටගත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කෙරිණි. එමෙන්ම වියත් සාකච්ඡා මඟින් ද දත්ත රැස් කිරීම සිදු විය.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

පර්යේෂණ ප්‍රතිඵල මත පදනම්ව විමසීමේ දී, **අං ඇදීම** සහ **පොරපොල් ගැසීම** වැනි ක්‍රීඩා පත්තිනි දේව ඇදහිල්ල හා මුසුව පවතී. එමඟින් පුද්ගල විශ්වාස, දේව ඇදහිලි හා චාරිත්‍ර විධි පිළිබිඹු වේ. ගජබා රාජ්‍ය සමය තෙක් දිවෙන මෙම ක්‍රීඩා ඉතිහාසය, ඓතිහාසික වශයෙන් රාජ පාලන සමය පිළිබඳව මෙන්ම ඉපැරණි ඇදහිලි පිළිබඳව ද කරුණු අනාවරණය කරයි. මස් මාංශ අනුභවයෙන් වැළකී සිදු කරණු ලබන මෙම ක්‍රීඩා ගැමි ජනයාගේ එකමුතු බව විදහාලයි. පත්තිනි මෑණියන් හා පාලඟ කුමරු අතර ඇති වූ ''**කෙකි පැටලිල්ල**'' මෙම ක්‍රීඩාවලට මුල් වී තිබේ. '**උඩුපිල**' හා '**යටිපිල**' අතර පැවැත්වෙන මෙම තරගවලින් යටිපිල හෙවත් පත්තිනි දේවියගේ පිල ජය ගැනීමෙන් ගමට සෞභාග්‍යය හා ශාන්තිය උදාවන බව පැරන්නන්ගේ විශ්වාසයයි. ක්‍රීඩාව අවසානයේ ජය ලබන පිරිස කවුරුන්ද යන වග ක්‍රීඩාව ආරම්භයටත් පෙරම කිව

හැකි එකම ක්‍රීඩාව තත් ක්‍රීඩාව වේ. තරුණ ජවය ඔපනැංවූයේ **චක්ගුඩු** ක්‍රීඩාවෙන් වන අතර **කඹ ඇදීමෙන්** සාමුහිකත්වය සංකේතවත් කෙරිණි. සාම්ප්‍රදායික ක්‍රීඩා මඟින් සිදු වූ පුද්ගල පෞරුෂ වර්ධනය අතිමහත්ය. **ඔලිඳ කෙළිය** සඳහා ක්‍රීඩකයන් දෙදෙනෙකි. මෙය ගෘහස්ථ ක්‍රීඩාවකි. ඔලිඳ ක්‍රීඩා කරණ පුවරුව '**ඔලිඳ කොළොම්බුව**' ලෙස හඳුන්වනු ලබන අතර පුවරුව මත තරමක් විශාල වලවල් දෙකක් සහ ඊට වඩා කුඩා වලවල් දෙපැත්තට හත බැගින් දහහතරක් තිබේ. වරකට ඔලිඳ ඇට හතර බැගින් වලවල් තුළට දමනු ලබන අතර සියලු ම ඔලිඳ ඇට සංඛ්‍යාව පනස් හයකි. තත් ක්‍රීඩාව සිදු කිරීමේදි විටින් විටින් දැත් මාරු කිරීම සිදු වෙයි. මෙය ශරීරයේ ඉන්ද්‍රියන් උත්තේජනයට හේතුවකි. තත් ක්‍රීඩාව තුළින් මානසික සංසුන් බව, ඉන්ද්‍රිය උත්තේජන හා බුද්ධිය වර්ධනය කිරීම සිදු විය. **සීරුමාරු** ක්‍රීඩාව සීරු මාරුවටම සිදු කළ යුතු ක්‍රීඩාවකි. පුවරුවක් මත සිදුරු තිස් එකක් තිබෙන අතර ඒ සෑම සිදුරකම එක බැගින් කුඩාවට සැකසූ ලී උල් ගසා තිබෙන අතරම එක පැත්තකට වෙන්න තනි කළු ඉත්තෙක් තිබෙයි. එක ඉත්තට එක ඉත්තා උඩින් කපමින් මැද තිබෙන සිදුරෙහි කළු පැහැති ඉත්තා ඉතුරුවන පරිදි අනෙක් සියලුම ඉත්තන් කැපීම සිදු කළ යුතුයි. අතීත මුතුන් මිත්තන් මෙයින් බලා පොරොත්තු වූයේ බුද්ධිය වර්ධනය කිරීමයි. තම දියණිය බලන්නට නිවසට පැමිණෙන බෑනට මාම විසින් ආහාර සැකසෙන තෙක් විසඳන්න දෙන ක්‍රීඩාවකි **මගුල් පරක්කුව** එය ඉතා මත් බුද්ධිමත් ලෙස මනස මෙහෙයවා සිදු කළ යුතු ක්‍රීඩාවකි. හතරැස් පුවරුවක් මත කුඩාවට කපන ලද හතරැස් ලී කැබලි එකොළහක් අතුරණු ලබයි. ඉන් ලී කැබලි දෙකක් කුඩා වන අතර තවත් එක ලී කැබැල්ලක් විශාල වෙයි. අනෙක් සියල්ලම එක හා සම වෙයි. යම් නිශ්චිත රටාවකට අතුරන ලද ලී කොටස් කිසිම මොහොතක නෝඋස්සා, මැදට වෙන්න තබන විශාල ලී කැබැල්ල එළියට ගත යුතු යි. මෙයින් තම දියණිය විවාහ කරගන්නාගේ බුද්ධි මට්ටම, ඉවසීම, කාර්යශූර බව, මාමාට පසක් වෙයි. තත් ක්‍රීඩාව අප ලාංකේය ජනක්‍රීඩා අතර නූතනය වන විට අභාවයට ගොස් ඇති ප්‍රධාන පෙළේ ක්‍රීඩාවකි. බහුතරයක් පිරිස තත් ක්‍රීඩාව පිළිබඳ නොදනියි. **රටවල් ඇල්ලීම** නම් ක්‍රීඩාව තුළින් දේශයට ඇති ඇල්ම වර්ධනය කිරීම, යොවුන් ජවය, ක්‍රියාශීලී බව, ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කරවයි. මෙම ක්‍රීඩාව සිදු කිරීමේදි දෙපිරිසකට බෙදී රාජ්‍ය යැයි නම් තබන ගස් දෙකක් ආරක්ෂා කිරීම මෙහි දි සිදු වෙයි. දෙපිරිසෙන් එකිනෙකා රාජ්‍ය අත් හරිමින් ඉදිරියට පැමිණෙ යි. මෙසේ පනිමින් එකිනෙකා පසු පස හඹා ගොස් ඔවුන්ට පහර දී අල්වා ගැනීම සිදු වෙයි. මෙසේ සිදු කරමින් අවසානයේ දී රාජ්‍ය අල්ලා ගැනීමක් සිදු වෙයි. නූතන සමාජය තුළ තත් ක්‍රීඩාව නව මුහුණුවරක් ගෙන තිබේ. ඒ '**ගස් පුච්චනවා**' යන්නයි. තත් ක්‍රීඩාව පානදුර, කෙසෙල් වත්ත ප්‍රදේශයේ එක් ඉගෙනුම් ආයතනයක සිසුන් පිරිසක් ගස් පුච්චනවා යන්න ව්‍යවහාර කරයි. පැරණි නීති යම් තාක් දුරට එහිදී වෙනස් වී ඇති බව දක්නට ලැබුණි. **දාම් ඇදීම** එදා කෝපි කඩේ තේ කහට උගුරක් සප්පායම් වන කා අතරත් සිදු වුන ක්‍රීඩාවකි. පුවරුවක් මත පාට දෙකකින් කොටු හැටක් තිබේ. ඒ පාට දෙකින් ඉත්තෝ තිහ බැගිනි. එකිනෙක ඉත්තෝ බැගින් කැපීම මෙහිදි සිදු වෙයි. ක්‍රීඩාවට සහජ පුරුද්ද තිබෙන දෙදෙනෙකු ක්‍රීඩාව පටන් ගතහොත් වරුවකට හමාරකට තත් ක්‍රීඩාව හමාර කළ නොහැක. බුද්ධි වර්ධනයට, දුරදිග සිතා කටයුතු කිරීමට මෙයින් පිටුබලයක් ලබා දෙයි. **ගුඩු විදීම** ළමුන් අතර ප්‍රසිද්ධ ක්‍රීඩාවකි. මෙය සිදු කිරීමේදි නිශ්චිත සීමාවක් තෝරාගනියි. දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසකට මෙම ක්‍රීඩාව සිදු කළ හැකි අතර භාවිතයට ගැනෙන ක්‍රීඩා උපකරණ වනුයේ දෑතට අසුවන ප්‍රමාණයේ කෝටු කැබලි දෙකකි. එක් කෝටු

කැබැල්ලක් අඟල් දෙකක් පමණ වන අතර අනෙක අඩි පහක් පමණ වන රිටකි. අඟල් තුනක් පමණ වළක් තත් කෝටු කැබැල්ලෙන් හාරා වලේ හරස් අතට කුඩා ලී කැබැල්ල විසිවෙන පරිදි ගුඩු රිටෙන් විදිම සිදු කරයි. මෙසේ විසිවන කුඩා ලී කැබැල්ල හෙවත් '**ගුඩ්ඩා**' අනෙක් ළමුන් අල්ලා ගත හොත් හෝ සීමාවෙන් එපිට ගියහොත් ගුඩු විදින්නා පරාජයට පත් වෙයි. තරග කරුවා පරාජයට පත් නොවන අවස්ථාවලදි ගුඩ්ඩා දෑතට ගෙන දමලා ගසන අවස්ථා තිබේ. එයද බිම දිගේ නොහැකිය. උඩින් එවිය යුතු වේ. ගුඩ්ඩා විදින්නාගේ ගතෙහි දැවටුණ හොත් ඔහු පරාජයට පත් වේ. ගුඩු වලේ සිට ගුඩ්ඩා වැටෙන දුර මැන ජය ලබන්නා තීරණය කරණු ලබයි. වැඩිම දුර විදින ලද ක්‍රීඩකයා ජය ගන්න අතර අනෙක් ළමෝ ඔහුව දෑත් බැද ආසනයක් සකසා ඔසවා ගෙන ඔල්වරසන් දෙමින් සතුටු වෙයි. මෙම ක්‍රීඩාව තුළින් ජය-පරාජය දරාගැනීම, ජයග්‍රහණය ම නොවේ. සතුට යන්නත් සාමුහිකත්වයේ සබැඳියාවත් ඉන් ප්‍රතීයමාන කරවයි. තත් සෑම ක්‍රීඩාවක් ම පාහේ සාමුහිකත්වය, බුද්ධි වර්ධනය, ඉවසීම, දරාගැනීම, අභිමානය, ස්වයං විනය, දේව භක්තිය පදනම් කරගත් සංස්කෘතිය පිළිබිඹු කරණ ක්‍රීඩාවන්ය. දේශීය අමු ද්‍රව්‍ය යොදා ගනිමින් තත් ක්‍රීඩා සියල්ලක් ම පාහේ සිද්ධ කරන ලදී. වර්තමානයේ මෙම ක්‍රීඩා අභාවයට යමින් පවතියි. 'Puñata' ක්‍රීඩාවට සමාන ලෙස වාසනා මුට්ටි බිඳීමත්, 'Pun the taul on the donkey' ක්‍රීඩාවට සමාන ලෙස අලියට ඇස තැබීමත් දකනට ලැබේ. මීට අමතරව '**බනිස් කෑම, බෝතලයට වතුර පිරවීම, තොප්පිය පාස්කිරීම, සංගීත පුටු තරගය, පැණි බඹරෙ** හා **සීනි බෝල සෙවීම**' වැනි හුදෙක් විනෝදාස්වාදය මූලික කරගත් ක්‍රීඩා 'ජනක්‍රීඩා' ලෙස හඳුන්වනු පෙනේ. මෑතකදී වාර්තා වූ ඇතැම් සිදුවීම් සංස්කෘතික පිරිහීමක් පෙන්නුම් කරයි. අවුරුදු උත්සවයක කාන්තාවන්ගේ කුස මත බනිස් තබා කෑමේ පුවතක් මෙන්ම, මත්පැන් බෝතල් කාන්තාවන්ගේ පියවුරු සමීපයේ තබාගෙන බීමේ තරග ද සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය විය. ඔලිඳ කෙළිය වැනි ක්‍රීඩා තුළින් ලාංකේය කෘෂිකාර්මික ඉඟි සැපයූ අතර, අද වන විට ඔලිඳ වැනි දේශීය අමුද්‍රව්‍ය ඉවත දමා ප්ලාස්ටික් බෝතල් ආදේශ කරගැනීම නිසා එම වටිනාකම් නැති වී ගොස් ඇත. එමෙන්ම **කොට්ටාපොර** වැනි ක්‍රීඩා මඟින් පවා වර්තමානයේ උත්සාහ කරණුයේ පුද්ගලයන් හිංසනයට පත් කොට හෝ ජයග්‍රහණය ලබා ගැනීමයි. නූතන ක්‍රීඩා මඟින් ලාංකේය අනන්‍යතාව විද්‍යමාන නොවන අතර, බටහිර ජාතීන් පවා මේවා දකින්නේ බටහිර අනුකරණයක් ලෙසිනි. එබැවින් ජන ක්‍රීඩා ව්‍යුහය සංශෝධනය විය යුතුය. අවුරුදු උත්සව සංවිධානය කිරීමේ දී නීති-රීති මාලාවක් සම්පාදනය විය යුතු අතර, සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය වන අශෝභන දර්ශන වැළැක්විය යුතුය. සාම්ප්‍රදායික ක්‍රීඩා පිළිබඳ දැනුම පාසල් විෂය මාලාවට ප්‍රායෝගිකව ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වේ.

**නිගමනය**

සාම්ප්‍රදායික ක්‍රීඩා සහ නූතන ක්‍රීඩා අතර පවතින සම්බන්ධතාව විශ්ලේෂණය කරන ලද අතර එමගින් විද්‍යමාන වනුයේ දිගින් දිගටම විනෝදාස්වාදය, බටහිරකරණය හා ලිංගිකත්වය මුසු වූ විනෝදජනක ක්‍රීඩා පමණක් ලාංකේය සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වුවහොත්, සාම්ප්‍රදායික ක්‍රීඩා අභාවයට ගොස් සාමුහිකත්වය, අවිහිංසාව හා ඇඳහිලිවලින් තොර අසහනකාරී සංස්කෘතියකට අපට උරුමකම් කීමට සිදු වන බවයි.

**ප්‍රමුඛ පද**- අවුරුදු උත්සව, අවුරුදු ක්‍රීඩා, සංස්කෘතිකාංග, සාම්ප්‍රදායික ජනක්‍රීඩා, ගැමි සමාජය

## ආශ්‍රිත ග්‍රන්ථ


අරන්ගල, ටී.බී. අරන්ගල, රුක්මණී සහ අරන්ගල, වරුණී. (2003) *සිංහල ජනකවි හා ජනක්‍රීඩා.* ප්‍රථම මුද්‍රණය. මරදාන: මල්පියලි ප්‍රකාශකයෝ.

දළුපොත, මහින්ද කුමාර (2012). *අපේ ජනක්‍රීඩා*, ප්‍රථම මුද්‍රණය, කොළඹ: සුසර ප්‍රකාශකයෝ.

ඉහගම, එස්., (2015). *කාන්තාවන් කේන්ද්‍රීය ජන ක්‍රීඩාවන්හි සමාජ හා මානව විද්‍යාත්මක වටිනාකම* (කාන්තාවන්ට ආවේණික සිංහල ජනක්‍රීඩා කිහිපයක් ආශ්‍රයෙන් සිදු කෙරෙන විමර්ශනයකි). Doi: https://share.google/9ChT53K5K71UXx8X7

ගමගේ, යු.ජේ.ජේ. (2020). *ගම්මඩු ශාන්තිකර්මය මුල්කර ගත් අංකෙළිය ජනක්‍රීඩාව පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක්.* In:, එච්.කේ, ලොකුහැන්නැදිගේ, ed. *Proceedings of the Undergraduate Research Symposium on Archaeology and Heritage Management-* (URSARU 2020). මිහින්තලේ: ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. doi: https://share.google/9ChT53K5K71UXx8X7.

සුදර්ශිකා ශ්‍යාමලී ප්‍රියදර්ශනී, ඩබ්. (2025). *සාම්ප්‍රදායික අංකෙළිය:* විල්ලද්දර පුරාණ රජමහා විහාරය ඇසුරෙන් විමසුමක්. BPU UNDERGRADUATE SYMPOSIUM IN ARCHAEOLOGY, 2.

Perera, H.P.N. (2023). Traditional Games and the Sri Lankan Culture; Reflection of Traditional Games as a Component of Implicit Culture of Sri Lanka. *International journal of scientific research and management*, 11(08), pp.06-10. Doi: https://doi.org/10.18535/ijsrm/v11i08.ss02.

Perera, P. (2021). *A Study on the Origins of Children Games*.

Yumna, A., Rathnayake, Y. and Ranasinghe, D. (2023). *Exploring The Role of Sri Lankan Traditional Games in Promoting Physical Development Among Children: in Light of Literature*. IJNRD.ORG IJNRD2306502 International Journal of Novel Research and Development (www.ijnrd.org) f17 |, [online] 8(6), pp.2456–4184. Available at: https://www.ijnrd.org/papers/IJNRD2306502.pdf.


## විද්‍යුත් මූලාශ්‍රය (You Tube)


Gossip, L.T. (2026). හැමෝම හොයපු චන්දිමාල්ගේ අවුරුදු උත්සවය *cj aurudu uthsawaya 2026*. [online] Youtu.be. Available at: https://youtu.be/Dk00491nFUg?si=YkjcSWrib_0MBbrd

[Accessed 1 Jun. 2026].

දොන් ජේ D.J. (2026). චන්දිමාල්ගේ අවුරුදු උත්සවය | *Chandimal Jayasinghe 2026 | Highlights*. [online] Youtu.be. Available at: https://youtu.be/1SrOx-PZUWo?si=RzbWHCIqVeXYSs37 [Accessed 1 Jun. 2026].

විරිදු නලින් V.N. (2026). *රාජකීය අවුරුදු උත්සවය චන්දිමාල් ජයසිංහ* | Viridu Nalin විරිදු නලින් [online] Youtu.be. Available at: https://youtu.be/FrAruUSLngk?si=nVeCvCMS42x5r9MH [Accessed 1 Jun. 2026].